**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2013**

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනත, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 1980 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 20 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. අචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාව 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති 3(iii) ප්‍රකාරව තොරතුරු සොයාගැනීමට නොහැකි පාඨමාලා හැර අන් සියළු පාඨමාලා ආදායම් පාඨමාලා කාලයට සමානුපාතිකව ගිණුම්ගත කරන බව දක්වා ඇතත් එම ආදායම් ලැබූ වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල ආයතනය විසින් පශ්චාත් උපාධි පාඨමාලා 65 ක් මෙහෙයවා තිබූ අතර ලියාපදිංචි ගාස්තු රු.15,577,280 කින්ද පාඨමාලා ගාස්තු රු.51,498,749 කින් ද විභාග ගාස්තු රු.65,739,286 කින් ද වශයෙන් රු.132,815,315 ක ආදායමක් පාඨමාලා ආදායම් වශයෙන් ලැබී තිබූ අතර ඒ ඒ පාඨමාලා සඳහා පාලන ගිණුම් පවත්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල පාඨමාලා ආදායම මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශයට සමානුපාතිකව බැර කර ඉදිරි කාලය සඳහා ලැබෙන ආදායම් විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කළයුතු වුවත් වර්ෂය තුල ලද ආදායම පාඨමාලා ආදායම ලෙස ගෙන තිබුණි. පාඨමාලා 08 ක් සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී එම පාඨමාලා වල සමස්ථ අදායම රු.8,699,500 ක් වූ අතර එයින් රු.3,491,380 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ආදායමක් ලෙසත් රු.3,330,480 ක් මූල්‍ය තත්ව ප්‍රකාශයට විලම්භිත ආදායම් ලෙසත් ගැලපියයුතු වුවද වර්ෂය තුල ලද සමස්ථ ආදායම වූ රු.3,644,500 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට බැර කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ ආදායමට හා වියදමට එරෙහිව ගලපන ලද පිළිවෙලින් රු.146,012,472 ක් හා රු.238,316,770 ක් අතීතානුයෝගීව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම වෙනුවට සමුච්චිත අරමුදලට ඇතුළත් කර තිබුණි.

**2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

රජයේ අමාත්‍යාංශයකින් හා රාජ්‍ය බැංකුවකින් එකතුව රු.6,712,875 ක් වූ ලැබියයුතු පාඨමාලා ගාස්තු රු.4,046,625 ක් හා කුලී ආදායම් රු.2,666,250 ක් වසර 02 සිට වසර 06 දක්වා කාල පරාසයක් ගතවී ඇතත් විගණිත දිනය දක්වාම අය නොවී පැවතුණි.

**2.4 නොසැසඳු පාලන ගිණුම්**

ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොගැනීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයෙහි දැක්වෙන ජංගම නොවන වත්කම් අයිතම් 03 ක් ස්ථාවර වත්කම් ලේඛනය සමග සැසඳීමේදී රු.189,425,356 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය .

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල යොමුව |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 29(ඊ) වගන්තිය හා 1980 අප්‍රේල් 10 දිනැති අංක 83/7 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි නියමාවලියේ 12(3)වගන්තිය | පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා පාඨමාලා සැලසුම් සකස්කර විශ්වවිද්‍යාල සනාථන සභාවේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 2005 දෙසැම්බර් 19 දිනැති අංක පීඊඩී/33 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගතයුතු වුවත් රු.92,887,489 ක් වූ ආයෝජන වෙනුවෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණ ද ලැබී නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා විශේෂිත ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පොදු ආකෘතිපත්‍ර 287 ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගතයුතු වුවත් ආයතනය භාවිතා කරන ස්ථාවර වත්කම් ලේඛනයේ සමුච්චිත ක්ෂය, අපහරණය කළ වත්කම්, වර්ෂයේ දැරූ මූලධන පිරිවැය යනාදී තොරතුරු ඇතුළත්වී නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 371 | නිශ්චිත කාර්යයක් සඳහා ලබාගත් අත්තිකාරම් අදාළ කාර්යය නිමවූ වහාම පියවියයුතු වුවත් අවස්ථා 18 කදී නිලධාරීන් 08 දෙනෙකු සඳහා ලබාදී තිබූ අත්තිකාරම් දින 40 සිට දින 139 ක කාල පරාසයක් තුළ නිරවුල් කර නොතිබූ බව නිරීක්ෂණය විය. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් රු.113,550 ක් වූ ටෙන්ඩර් තැන්පතු හා රු.183,557 ක් වූ විවිධ තැන්පතු අදාල කාර්යය අවසන් වූ වහාම පියවියයුතු වුවත් ඉහත තැන්පතු වටිනාකමින් රු.87,050 ක් වූ ටෙන්ඩර් තැන්පතු හා රු.144,717 ක් වූ විවිධ තැන්පතු වසර 03 කට අධික කාලයක් පියවා නොතිබූ බව නිරීක්ෂණය විය. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.10,331,320 ක අතිරික්තයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.11,434,802 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.1,103,482 කින් අඩුවීම සඳහා රජයේ ප්‍රදාන රු.15,180,000 කින් වැඩිවීම හා වෙනත් ආදායම් රු.41,672,778 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ආයතනය විසින් විගණනයට ඉදිරිපත්කර තිබූ රාජකාරි ලැයිස්තු හා එදිනට ආයතනයේ සේවයේ නිරතව සිටි සේවකයින් සැසදීමේදී නිලධාරීන් 81 දෙනෙකු සඳහා ආයතනය විසින් රාජකාරි ලැයිස්තු ලබාදී නොතිබූ අතර ලබාදී තිබුණු රාජකාරි පැවරුම් 1994-2004 වර්ෂවල ලබාදී තිබුණු ඒවා වන අතර වර්තමාන රාජකාරි අනුව ඒවා යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීම සඳහා ආයතනය විසින් පෞද්ගලික ආයතනයකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබූ අතර, එම කාර්යය නිම කිරීම සඳහා දින 53 ක් ප්‍රමාදවී තිබියදීත් මුළු මුදලම වන රු.1,458,286 ම අදාල පෞද්ගලික ආයතනයට ගෙවා තිබුණි.

**4.2 කාර්ය මණ්ඩල පරිපාලනය**

2013 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය අනුව කථිකාචාර්යවරු සංඛ්‍යාව 11 ක් වූ අතර ඉන් තනතුරු 08 ක් පුරප්පාඩු වී තිබුණි. මෙසේ අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු වී තිබීම ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි ඍජුව බලපාන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**4.3 ආයතන නිලධාරීන් අතර වැඩ පැවරීම්**

ආයතනය විසින් අභ්‍යන්තර පාලනය සවිමත් කිරීම සඳහා නිශ්චිත කාලයක් අවසානයේ නිලධාරීන් කාර්යයන් අතර මාරුකළ යුතු වුවත් නිලධාරීන් 26 දෙනෙක් වසර 07 සිට වසර 32 ක කාලයක් එකම කාර්යයෙහි අනුයුක්ත කර තිබූ බව නිරීක්ෂණය විය.

**4.4 දෘෂ්‍ය අක්‍රමිකතා**

සමාලෝචිත වර්ෂයේ මුල් කාර්තුව තුල ආයතනයේ අධ්‍යයන අංශයේ පවත්වන ලද රැස්වීම් සඳහා දැරූ සංග්‍රහ වියදම් පිළිබඳ සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී ක්ෂණික ආහාර ලබාදීම වෙනුවෙන් ගෙවීම් කිරීමේදී රබර් මුද්‍රාව සහ ප්‍රමාණයන් වෙනස්කර ව්‍යාජ අත්සන් යොදා ඉදිරිපත් කළ බිල්පත් 116 ක් සඳහා වවුචර් 12 ක් මගින් රු.286,384 ක මුදලක් ගෙවා තිබුණි.

**5. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

**5.1 අයවැය පාලනය**

ආයතනය විසින් පවත්වාගෙන යන එක් එක් පාඨමාලා සඳහා වෙන වෙනම අයවැය ඇස්තමේන්තු සකස් කර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම් පාලනය
(ආ) සේවක පරිපාලනය
(ඇ) ගිණුම්කරණය